// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2468/08 - 2025 දෙසැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2025.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1) (ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 101137 දරන සහ ඉංගිරිය පාර, මීපේ, පාදුක්ක යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2024 පෙබරවාරි මස 29 දින අංක 2373/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වැනි උපලේඛනයේ, එහි I වැනි තීරයේ දැක්වෙන “ඉලෙක්ට්‍රොනික සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති”යන සටහනට හා එහි II වැනි තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වැනි උපලේඛනයේ පිළිවෙලින් I වැනි සහ II වැනි තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වැනි උපලේඛනය**

කොන්දේසි

1. ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත (එස්. එල්. කියූ. එෆ්. 6 වැනි ස්ථරයේ), ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්;

   (i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතිය විද්‍යා විෂය ධාරාවේ විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවේ හෝ ජීව විද්‍යා විෂය ධාරාවේ හෝ වාණිජ විෂය ධාරාවේ විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (එස්) සහ තෙවන විෂය ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (එස්) එකවර ලබාතිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; සහ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම යන අවම ඇතුළත්කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

II වැනි උපලේඛනය

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| උපාධිය | උපාධිය සඳහා වන කෙටි යෙදුම |
| ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (ව්‍යාපාර විශ්ලේෂණය) |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.